සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

11 - බුද්ධ ධර්මය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

Scanned with CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
අ.පොස. (සා.පෙළ) විභාගය - 2020

II - බුද්ධ ධර්මය
අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය : බහුවරණ ප්‍රශ්න 40 කි = (1 x 40) **ලකුණු 40 යි**

II පත්‍රය : 1 වැනි ප්‍රශ්නය කොටස් 10 කි කෙටි පිළිතුරු (2 x 10) **ලකුණු 20 යි**

(2 - 7 තෙක් තෝරාගත් ප්‍රශ්න 04 කට)

2 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

3 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

4 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

5 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

6 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

7 වැනි ප්‍රශ්නය එක් කොටසකට ලකුණු 5 බැගින්

(ලකුණු 5 X 2) ලකුණු 10 යි.

ලකුණු 40 යි.
මුළු ලකුණු 100 යි.

අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රයට ලකුණු	= 40
II පත්‍රයට ලකුණු	= 60
මුළු ලකුණු	= 100

Scanned with CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

11 - බුද්ධ ධර්මය

සවිස්තර ලකුණු දීමේ පටිපාටිය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවේ දැක්වෙන පරිදි ජාතික අධ්‍යාපන පද්ධතිය මගින් ඉටුකරගත යුතු ජාතික පොදු අරමුණු 08 ක් වේ. එසේම මූලික නිපුණතා 07 ක් දැක්වේ. විධිමත් අධ්‍යාපනය මගින් මෙකී අරමුණු හා නිපුණතා සාක්ෂාත් කර ගැනීම අපේක්ෂිතය. මූලික නිපුණතා අතර පස්වැන්න ආගම හා ආචාර ධර්මයන්ට අදාළ නිපුණතාව වේ. එය පහත දැක්වේ.

5. ආගම් සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතාව

"පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සාදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහා ගැනීම හා ස්වීයකරණය."

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක සමස්ත විෂයමාලාව තුළින් පොදු අරමුණු හා මූලික නිපුණතා ඉටුකරගත යුතු අතර, ආගමික අධ්‍යාපනය තුළින් ඉහත දැක්වෙන පස්වන නිපුණතාව සුවිශේෂීව සපුරාගත යුතුව පවතී.

බුද්ධ ධර්මය විෂය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී එහි විෂය කරුණු ප්‍රායෝගිකත්වයට නැඹුරු කරවීම වර්තමාන යුගයට අත්‍යවශ්‍යව පවතී. වනපොත්කරණයෙන් විෂය කරුණු හදාරා විභාග සමත්වීම එකම අරමුණ නොවිය යුතු අතර, ඉන් ඔබ්බට ගොස් දෛනික ජීවිතයේ විවිධ ගැටලුවලට සාර්ථකව මුහුණ දීමටත් දහම් කරුණු භාවිතයට ගැනීමටත්, බුදු දහමේ ඉගැන්වෙන ශ්‍රේෂ්ඨ ධර්ම කරුණු අනුව තම ජීවිතය සාර්ථක කරගැනීමටත් සිසුන් යොමු කරලීම අත්‍යවශ්‍ය වේ. සම්බර පෞරුෂයකින් හෙබි සැදැහැති බෞද්ධයකු දැයට දායාද කිරීම බුදු දහම ඉගැන්වීමේ මූලික අරමුණු විය යුතුය. බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරුවරයා මේ පිළිබඳ සුවිශේෂීව අවධානය යොමු කළ යුතුවේ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ සැකසුන විෂයමාලාවක් පාසල් පද්ධතියට ඉදිරිපත් කෙරිණි. ඒ අනුව බුද්ධ ධර්මය විෂයයේ අරමුණු 07 ක් දැක්වේ. මෙම අරමුණු සපුරාලන අයුරින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකසා ගත යුතුවේ. එම විෂය අරමුණු මෙසේයි.

Scanned with CamScanner

විෂයයේ අරමුණු

01. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවෙන් කටයුතු කරන, නිවැරදිව ප්‍රායෝගික වතාවත්වල යෙදෙන දැහැමි දරු පරපුරක් බිහිකිරීම.

02. ජීවන ගමනේ දී මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සහ නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට බුදු දහමෙහි මූලික ඉගැන්වීම් උපයෝගී කර ගැනීම පිණිස දරු පරපුරට මග පෙන්වීම.

03. සුපෙරුෂයක් ගොඩනගා ගැනීම උදෙසා බෝසත් චරිතය, බුද්ධ චරිතය හා සිව්වනත් පිරිසට අයත් ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශ කොට ගැනීම සඳහා මග පෙන්වීම.

04. ශ්‍රී ලාංකීය උරුමය දයාද කොට ගත් අභිමානවත්, වගකීමෙන් සහ වගවීමෙන් යුතු දරු පරපුරක් ගොඩනගා ගැනීම.

05. සිය ජීවන දර්ශනය ගොඩනගා ගැනීමේ දී ධම්මපද දේශනා සහ බෞද්ධ උපදේශ කාව්‍ය පදනම් කරගත් ඉගැන්වීම් චරිතායනයට මග පෙන්වීම.

06. මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

07. බෞද්ධ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂ අංග අධ්‍යයනය කොට, සහජීවනයෙන් කටයුතු කරන සිය අනන්‍යතාව රැක ගත් දරු පරපුරක් ගොඩනගා ගැනීම.

එසේම 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් ද්විතියික විෂය නිර්දේශය මූලික නිපුණතා 10 ක් යටතේ ගොනු කර ඇත. 6 ශ්‍රේණියේ සිට නිපුණතා මට්ටම් හා විෂය අන්තර්ගතය ක්‍රමයෙන් ගැඹුරින් හා පළලින් වැඩිවන ලෙස සර්පිලාකාර ක්‍රමයට වනාප්ත වන ලෙස සැකසී ඇත. බුද්ධ ධර්මය විෂයයේ නිපුණතා 10 පහත දැක්වේ.

බුද්ධ ධර්මය විෂයයේ නිපුණතා

01). තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.
02). ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක, ශ්‍රාවිකා චරිත උපයෝගී කර ගනියි.
03). බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.
04). සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි.
05). ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.
06). බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.
07). ජීවී, අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි.
08). ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.
09). බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි.
10). නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

ඉහත දැක්වූ විෂය අරමුණු 07 පෙරදැරි කරගෙන නිපුණතා 10 සම්පූර්ණ වන ලෙස විෂය ඉගැන්වීම සාර්ථකව සිදු කළේ නම් සිසුන් තුළ යහපත් ගුණවතාවන් සිදුවනු ඇත. මෙම අවශ්‍යතාවන් ඉටුවන ලෙස ප්‍රායෝගිකත්වයට නැඹුරුව තක්සේරුකරණය පාසල් පාදකව සිදුවිය යුතුය. අ.පො.ස. (සා.පෙළ) විභාගය යනු විෂය දැනුම පිළිබඳ සමාප්තික ඇගයීම වේ.

Scanned with CamScanner

බුද්ධ ධර්මය විෂයය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වෙයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මෙම ප්‍රශ්න පත්‍ර සැකසී ඇත. නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රියාවලියකට සිසුන් යොමු කිරීම නව විෂයමාලා ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිතය. නිපුණතාවක් (Competency) යනු දැනුම (Knowledge) ආකල්ප (Attitude) කුසලතා (Skills) සහ යහ පුරුදු (Good Practices) යන මේවායේ සමස්ත ඒකතුවේ ප්‍රතිඵලය වෙයි. දිගුකාලීනව ලැබූ ඉගෙනුම් ක්‍රියාවලියේ අවසාන ඵලය නිපුණතාවන්ගෙන් පිරි සම්බර පෞරුෂයෙන් යුතු යහපත් පුරවැසියන් වේ. බුද්ධ ධර්මය විෂයය න්‍යායාත්මකව සහ ප්‍රායෝගිකව හැදෑරීම තුළින් ආගම විෂයයට අදාළ නිපුණතා ශිෂ්‍යයා සපුරා ගෙන ඇත යනු අපගේ විශ්වාසයයි. ඇගයීම් ක්‍රියාවලිය ද නිපුණතා පාදකව සිදුකරලීම සඳහා ප්‍රයත්න දරා ඇත. අදාළ නිපුණතාව ශිෂ්‍යයා අත් කර ගෙන තිබේද යන්න මැන බැලීමට උචිත අයුරින් බොහොමයක් වණු සැකසී ඇති බව සිහියේ තබාගත යුතුය.

මෙම විෂයය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වෙයි. පළමුවැන්න බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. දෙවැන්න කෙටි පිළිතුරු සැපයීමේ හා ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්නවලින් යුක්තය. මෙම ප්‍රශ්න පත්‍ර සඳහා ලකුණු වෙන් කොට ඇත්තේ මතු දැක්වෙන පරිදි වේ.

I - පත්‍රය ලකුණු 40 යි

II - පත්‍රය ලකුණු 60 යි

මුළු ලකුණු 100 යි

Scanned with CamScanner

බුද්ධ ධර්මය - I

01. අධ්‍යාපන ක්‍රියා පද්ධතිය මඟින් ශිෂ්‍ය - ශිෂ්‍යාවන් තුළ ඥානුම් ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කිරීම මූලික අභිමතාර්ථය වෙයි. හුදු ඥානුම් පමණක් යහපත් ශිෂ්ට සම්පන්න පුරවැසියකු බිහි කිරීමට ප්‍රමාණවත් නොවේ. අංග සම්පූර්ණ පුරවැසියකු වීමට යහපත් ආකල්ප පෝෂණයක් ද තදනුබද්ධව සංවර්ධනය විය යුතු පුද්ගල කෞශල්‍යය ද අත්‍යාවශ්‍ය වෙයි. බුද්ධ ධර්මය විෂයය නිර්දේශය සැකසී ඇත්තේ ඥානුම, අකල්ප හා කුසලතා වර්ධනය සඳහාය. ඒ සඳහා බුද්ධ ධර්මය පාඨග්‍රන්ථ මඟින් විශාල ප්‍රයත්නයක් දරා ඇති අතර, ආකල්ප හා කුසලතා වර්ධනය විෂයය භාර ගුරු මහත්ම මහත්මීන්ගේ දායකත්වය මඟින් පෝෂණය කිරීම අපේක්ෂිතය. බුද්ධ ධර්මය ආගමික විෂයය නිර්දේශයක් වුවද එමඟින් හුදු ඥානුම පමණක් මනිනු නොලැබේ. ප්‍රශ්න සැකසී ඇත්තේ ඥානුම, ආකල්ප සහ කුසලතා විනිශ්චය කිරීම සඳහාය.

02. ප්‍රශ්න හතළිහකින් යුත් පළමුවැනි ප්‍රශ්න පත්‍රය සඳහා වෙන්ව ඇති කාලය පැයකි. ප්‍රශ්න පත්‍රයේ ම දැක්වෙන පිළිතුරු හතරකින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ලකුණු කිරීම විභාග අපේක්ෂකයා විසින් කළ යුතුය.

03. ප්‍රශ්නයට අදාළ පිළිතුර සේ පෙනෙන එහෙත් නිවැරදි පිළිතුරු නොවන පිළිතුරු තුනක් තිබේ. දී ඇති පිළිතුරු සටහනින් නිවැරදි පිළිතුර තෝරා ගැනීම සඳහා බුද්ධ ධර්මය මැනවින් හදාරා තිබිය යුතුය.

04. අසා ඇති ප්‍රශ්න වහා අවබෝධකර ගැනීමේ ශක්තිය විභාග අපේක්ෂකයා සතු විය යුතුය. ප්‍රශ්නය නිසි ලෙස තේරුම් නොගැනීම අසාර්ථක පිළිතුරක් සැපයීමට හේතු විය හැකිය. ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගැනීමෙන් පසු නොපමාව නිවැරදි පිළිතුර කුමක්දැයි හඳුනාගෙන ලකුණු කළ යුතුයි.

05. පැයක පමණ කෙටි කාලයක් තුළ මේ සියලු කාර්යයන් ඉටු කළ යුතුව ඇති බැවින් ප්‍රශ්න පිළිබඳව නිරවුල් අවබෝධ ඥානය හා කාර්යක්ෂමභාවය සාර්ථක පිළිතුරු සැපයීමට බෙහෙවින් උපකාරවත් වේ.

06. සරල ප්‍රශ්න හතළිහකින් යුත් මේ ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වන්නේ බුද්ධ ධර්මය විෂයය සම්බන්ධ සාමාන්‍ය දැනීම පරීක්ෂාකර බැලීමය.

07. මේ ප්‍රශ්න පත්‍රයේ පිළිතුරුපත් ලකුණු කිරීමට පළමු පහන සඳහන් කරුණු කෙරෙහි පරීක්ෂකවරුන්ගේ දැඩි අවධානය යොමුවිය යුතුය.

i. නිවැරදි වරණය තේරීමේ දී අපේක්ෂකයා ලකුණු කොට ඇත්තේ එක් වරණයක් පමණක් දැයි බලන්න. එක් වරණයකට වඩා වැඩි සංඛ්‍යාවක් ලකුණු කොට ඇත්නම් එම පිළිතුර ඉරක් ඇඳ කපා හරින්න.

ii. සිදුරුපත් භාවිත කරන පරීක්ෂකවරුන් ප්‍රශ්නයේ අංකයත්, නිවැරදි පිළිතුරත් පැහැදිලිව පෙනෙන සේ සිය සිදුරුපත සකස්කර ගත යුතුය.

iii. සිදුරුපත් මඟින් හරි වැරදි ලකුණු කිරීමේ දී නිවැරදි වරණය සඳහන් කොටුව මත ලකුණු කිරීමෙන් වලකින්න. පිළිතුරට අදාළ ප්‍රශ්න අංකය ඉදිරියෙහි හරි වැරදි ලකුණු කරන්න.

iv. නිවැරදි ලකුණු සංඛ්‍යාව ගණනය කොට අදාළ පේළිය යට මුළු සංඛ්‍යාව සටහන් කරන්න.

08. බුද්ධ ධර්මය ප්‍රශ්න පත්‍රයට අදාළ නිවැරදි උත්තර මතු දැක්වෙන සටහනෙහි පළවෙයි. නිවැරදි උත්තරයට එක් (01) ලකුණක් බැගින් හිමිවේ.

Scanned with CamScanner

බුද්ධ ධර්මය II

01. නව අධ්‍යාපන විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ විභාගය පැවැත්විණි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදකව (Competency Based) ක්‍රියාකාරකම් පාදකව (Activity Based) සිදුවන අතරම ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලියද නිපුණතා පාදකව නිර්ණායක මූලිකව (Competency Based Criterion Reference Assessment and Evaluation) සිදුකිරීමට ප්‍රයත්න දරා ඇත. නිපුණතාවක් දැනුම ආකල්ප කුසලතා හා යහපුරුදුවලින් යුක්ත වෙයි. නිපුණතාවක් දිගුකාලීනව ඇතිවන්කි. ආගම හා සදාචාරයට අදාළ නිපුණතාවන් මෙන්ම බුද්ධ ධර්මය විෂයානුබද්ධ නිපුණතාවයන් ශිෂ්‍යයා ලබාගෙන තිබේද යන්න මැන බැලීම සඳහා ප්‍රශ්න පත්‍රය සැකසී ඇත.

බුද්ධ ධර්මය විෂය ක්ෂේත්‍රය පිළිබඳ අපේක්ෂකයා තුළ නිවැරදි අවබෝධය හා විෂය කරුණු විස්තරාත්මකව ඉදිරිපත් කිරීමේ හැකියාව ද, තමන් උගත් විෂය කරුණු ජීවිතය හා සමාජය සම්බන්ධ කොට විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙන් දක්වන නිපුණතා ද විමසා බැලීම මේ ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථය වෙයි.

02. බුද්ධ ධර්මය II ප්‍රශ්න පත්‍රයෙහි මතු දැක්වෙන උපදෙස් දී ඇත.

පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

★ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් බැගින් ද හිමි වේ.

ඒ අනුව එක් එක් ප්‍රශ්නයට, කොටස්වලට ලකුණු ප්‍රදානය කිරීමේදී දිය යුතු ලකුණු ප්‍රමාණය මතකයෙහි තබා ගත යුතුය. පළමුවන ප්‍රශ්නයට ලකුණු (10 x 2) 20 කි. 02 සිට 06 දක්වා ප්‍රශ්නවල

i කොටසට ලකුණු 2 ක් ද, ii කොටසට ලකුණු 3 ක් ද, iii කොටසට ලකුණු 5 ක් ද වශයෙන් ලකුණු 10 බැගින් හිමිවේ. 7 වන ප්‍රශ්නයේ කොටසකට ලකුණු 05 බැගින් කොටස් දෙකට ලකුණු (5 x 2) 10 කි. ඒ අනුව II පත්‍රයට ලකුණු (20 + 10 x 4) 60 කි.

03. බුද්ධ චරිතය, ශ්‍රාවක ශ්‍රාවිකා චරිත, බෞද්ධ චරිත කථා, බෞද්ධ ධර්මය, බෞද්ධ සමාජය, බෞද්ධාගමික චාරිත්‍ර, බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම, බෞද්ධ සාහිත්‍ය හා කලාශිල්ප, බෞද්ධ ශාසන ඉතිහාසය, ලක්දිව බුදුසසුන ආදිය පිළිබඳ විෂය නිර්දේෂයට අදාළ කරුණු සම්බන්ධ සාමාන්‍ය ඥානය, විශේෂ ඥානය හා ප්‍රායෝගික අවබෝධය පරීක්ෂා කර බැලීම මේ ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වනු ලැබේ.

දෙවන පත්‍රයේ අංක 1 ප්‍රශ්නය ඉදිරිපත් කොට ඇත්තේ බුද්ධ ධර්මය මූලික විෂය කරුණු කෙටියෙන් ලියා දැක්වීම සඳහා කෙටි ප්‍රශ්න 10 කින් සමන්විත ප්‍රශ්නයක් ලෙසය. එහි දී ශිෂ්‍යයාහට නම් කිරීමක්, අර්ථ දැක්වීමක්, කෙටියෙන් හැඳින්වීමක් වැනි ප්‍රජානන හැකියා ලියා ඉදිරිපත් කිරීමට සිදුවේ. හිමි ලකුණු 20 කි. අංක 2 සිට 6 දක්වා ප්‍රශ්නවල i කොටසින් විෂයට අදාළ මූලික කරුණු පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම පරීක්ෂාවට ලක්කෙරෙයි. ii කොටසින් ඒ හා සම්බන්ධ කරුණු විග්‍රහ කොට ඇති අයුරු අපේක්ෂකයා මනාව වටහාගෙන ඇත්දැයි විමසුමට ලක්කෙරේ. iii කොටසින් අදාළ විෂය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ විචාරාත්මක අවබෝධය හා නිදහස් චින්තනය පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

Scanned with CamScanner

මෙම කොටස් තුනෙන් iii කොටසට සපයා ඇති පිළිතුරු බොහෝවිට ගැඹුරු නොවීමට පුළුවන. එහෙත් අසා ඇති ප්‍රශ්න නිවැරදිව වටහා ගෙන අර්ථවත් කරුණු ඉදිරිපත් කර තිබේ නම් පිළිතුර කෙටි වුව ද සාධාරණ ලකුණු ප්‍රමාණයක් දීම සුදුසුය.

7 වන ප්‍රශ්නයේ මාතෘකා දෙකකට කෙටි සටහන් ලිවීම අපේක්ෂා කෙරේ.

04. ශිෂ්‍යයා නිවහල් චින්තනයට යොමු කිරීම නූතන අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රධාන පරමාර්ථය ලෙස සලකනු ලැබේ. එබැවින් බුද්ධ ධර්මය II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී අදාළ පාඨ ග්‍රන්ථයන්හි අන්තර්ගතයට ම වහල් නොවී ස්වාධීනව ඉදිරිපත් කර ඇති නිවැරදි කරුණු පිළිබඳ ඔබේ අවධානය යොමු කිරීම මැනවි.

Scanned with CamScanner

I පත්‍රය - ඉගෙනුම් ඵල

1. බෝසත් චරිතයේ හා බුදු සිරිතේ සුවිශේෂී අවස්ථා නම් කරයි.
2. බෝසත් චරිතය හා බුද්ධ චරිතයේ සුවිශේෂී ගුණාංග දක්වයි.
3. බුද්ධ චරිතයේ සහ ශ්‍රාවක චරිත වල ඇති උතුම් ගුණාංග චරිතායනය කරයි.
4. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින ඒවා ආශ්‍රයෙන් තම ජීවිතය අර්ථවත් කර ගැනීමට සිතයි.
5. පාරමිතා අර්ථ සීමනය කර බෝසතුන් පාරමිතා පූරණය කල අවස්ථාවන්ට නිදසුන් සපයයි.
6. ගෘහස්ථ සීලය යන්න අර්ථ දක්වයි.
7. බුදු දහමේ මූලික ඉගැන්වීම් විස්තර කරයි.
8. බෞද්ධ කර්ම විග්‍රහයෙහි දැක්වෙන කොටස් නම් කරයි.
9. බෞද්ධ කලා ශිල්පයන්හි සුවිශේෂිතා අගය කරයි.
10. බෞද්ධ රාජ්‍ය පාලන ධර්ම අර්ථ දක්වයි.
11. ථෙරවාදී බෞද්ධ ධර්ම සංගායනාවන්ට අදාළ සුවිශේෂී අවස්ථා දක්වයි.
12. බෞද්ධ ශාසන ඉතිහාසයට අදාළ වැදගත් සිද්ධි දක්වයි.
13. ධම්ම පද පාඨයන්හි අර්ථ විවරණය කරයි.
14. බෞද්ධ සූත්‍ර ධර්ම ඇසුරින් මෙලොව ජීවිතය සාර්ථකව ගත කල හැකි ආකාරය පෙන්වා දෙයි.
15. බෞද්ධ සාහිත්‍ය කෘති පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
16. බෞද්ධ ධන පරිභෝග සංකල්පය විග්‍රහ කරයි.
17. බුදු දහමේ සිතීමට හා විමසීමට ලබා දී ඇති නිදහස අගය කරයි.
18. ධර්මාශෝක අධිරාජයාගේ ශාසනික සේවාව පහදයි.

Scanned with CamScanner

II පත්‍රය - ඉගෙනුම් ඵල

01.

I. බුද්ධ චරිතය, බෞද්ධ ශ්‍රාවක, ශ්‍රාවිකා චරිත හා බෞද්ධ සංස්කෘතියට අදාළ තොරතුරු නම් කරයි.
II. බුදු දහමේ මූලික ඉගැන් වීම් පහදයි.
III. සුවිශේෂී දහම් කරුණු අර්ථ සීමනය කරයි.
IV. ආදර්ශමත් බෞද්ධ චරිත ඇගයීමට ලක් කරයි.

02.

I. අනුසෝතගාමී හා පටිසෝතගාමී වචන අර්ථ සීමනය කරයි.
II. පද්මාකර ජීවිතයක ලක්ෂණ දක්වා එය අගය කරයි.
III. බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතාදර්ශ චරිතායනය කරයි.

03.

I. ධම්ම පද ගාථා නිවැරදිව සජ්ඣායනා කරයි.
II. ධම්ම පද ගාථා වල අදහස පැහැදිළි කරයි.
III. ධම්ම පද ගාථා වලින් දෙන සදුපදේශ ජීවිතයට සමීප කර ගනියි.

04.

I. බෞද්ධ සදිසා සංකල්ප නිවැරදිව අර්ථ දක්වයි.
II. සමාජ කණ්ඩායම් විසින් ඉටු කළ යුතු - යුතුකම් හා වගකීම් නම් කරයි.
III. අන්‍යෝන්‍ය යුතුකම් ඉටු කිරීම සමාජ යහපැවැත්මේ පදනම බව විස්තර කරයි.

05.

I. ථෙරවාදී බෞද්ධ ධර්ම සංගායනා වලට අදාළ සුවිශේෂී තොරතුරු දක්වයි.
II. පුස්ථ කාරූඪ ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු පහදයි.
III. ථෙරවාදී සංගායනා ධර්ම විනය දෙකෙහි අනාගත සුරක්ෂිතතාවට හේතු වූ බව විස්තර කරයි.

06.

I. බෞද්ධ ස්තූප ආකෘති නිවැරදිව නම් කරයි.
II. ස්තූපයක රූප සටහනක් ඇඳ කොටස් නම් කරයි.
III. ජාතික උරුමයන් සුරැකීමේ වැදගත්කම ඇගයීමට ලක් කරයි.

07.

I. ආදර්ශමත් බෞද්ධ චරිත කථා විස්තර කරයි.
II. බුදු දහම ඉදිරිපත් කරන 'සමජීවිකතාව' පැහැදිළි කරයි.
III. සතර අගතියෙන් තොර වීම යහපත් බෞද්ධ රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස අගය කරයි.
IV. නෙක්ඛම්ම පාරමිතාව පැහැදිළි කරයි.

Scanned with CamScanner

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ඉල්ලීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු පැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පැනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පැනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පැනක් භාවිතා කළ යුතුය.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) .... √ △ 4/5

(ii) .... √ △ 3/5

(iii) .... √ △ 3/5

03 එකතුව → □ 10/15

බහුවරණ උත්තරපත්‍ර :

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

Scanned with CamScanner

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඔවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.

(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.

***

Scanned with CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පොෙ.ස. (සා.පෙළ) විභාගය - 2020
க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2020

විෂය අංකය பாட இலக்கம் **11** විෂයය பாடம் **බුද්ධ ධර්මය**

I පත්‍රය - පිළිතුරු
I பத்திரம் - விடைகள்

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.
01.	3	11.	4	21.	4	31.	2
02.	4	12.	2	22.	2	32.	4
03.	3	13.	2	23.	1	33.	3
04.	1	14.	4	24.	4	34.	1
05.	3	15.	3	25.	3	35.	1
06.	2	16.	1	26.	2	36.	3
07.	3	17.	4	27.	3	37.	3
08.	4	18.	3	28.	1	38.	3
09.	2	19.	2	29.	2	39.	3
10.	1	20.	1	30.	2	40.	3

විශේෂ උපදෙස්
விசேட அறிவுறுத்தல்
} එක් පිළිතුරකට ලකුණු
ஒரு சரியான விடைக்கு **01** බැගින්
புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තිරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව சரியான விடைகளின் தொகை	**25** **40**
I පත්‍රයේ මුළු ලකුණු பத்திரம் I இன் மொத்தப்புள்ளி	**25** **40**

Scanned with CamScanner

II පත්‍රය - පිළිතුරු

1. (i) තුන්තරා බෝධිය නම් කරන්න.

(ii) "ගිලනුන්ට උපස්ථාන කරන්නා මටද උපස්ථාන කරන්නේ ය." මෙම දේශනාවෙන් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවති කිනම් බුදුගුණය ද?

(iii) "කායේන සංවරෝ සාධු - සාධු වාචාය සංවරෝ" මෙම පාඨයේ අදහස ලියන්න.

(iv) අනේපිඬු සිටුතුමා සහ විශාඛා මහෝපාසිකාව සම්බුද්ධ ශාසනයට පූජා කළ ආරාම **දෙක** අනුපිළිවෙළින් ලියා දක්වන්න.

(v) සතර සංග්‍රහ වස්තු නම් කරන්න.

(vi) "මාගේ මේ ව්‍යායාමය රජ සැප පිණිස නොව සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම උදෙසා ය". මෙම ආදර්ශය ඉදිරිපත් කළ රාජ්‍ය පාලකයා කවු ද?

(vii) 'භෝග සුඛය' යන්නෙහි අර්ථය කුමක් ද?

(viii) "ඉමස්මිං අසති ඉදං න හෝති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති" මෙම පාඨයේ අදහස ලියන්න.

(ix) බුදුගුණ අලංකාරය හා පූජාවලිය යන ධර්ම ග්‍රන්ථ දෙක රචනා කළ ගත් කතුවරුන් අනුපිළිවෙළින් නම් කරන්න.

(x) බුදුරජාණන් වහන්සේගේ දකුණු අකුඨාතුව තැන්පත් කොට දෙවනපෑතිස් රජතුමා ඉදිකළ ස්තූපය කුමක් ද?

I. බුදු, පසේබුදු, මහරහත්/ සම්මා සම්බුද්ධ, පච්චේක බුද්ධ, අරහන්ත බුද්ධ/ සම්මා සම්බුද්ධබෝධි, පච්චේකබෝධි, අරහන්තබෝධි (බුද්ධ)

1 - 0
2 - 1
3 - 2

(ලකුණු 02)

II. ගිලානෝපස්ථාන ගුණය/ ගිලනුන්ට උපස්ථාන කිරීමේ ගුණය/ ගිලානෝපස්ථානය.

රෝගීන්ට උපස්ථාන කිරීම.

(ලකුණු 02)

III. කයෙන් සංවර වීම (මැනවි) වචනයෙන් සංවර වීම මැනවි/ කායික වාචසික සංවරය (යහපත්ය)

1 - 1
2 - 2

(ලකුණු 02)

IV. ජේතවනාරාමය (දෙව්රම් වෙහෙර), පූර්වාරාමය අනිළිවෙලට ලියා ඇත්නම් ලකුණු නැත.
මිගාරමාතු ප්‍රාසාදය, පුබ්බාරාමය

(ලකුණු 02)

V. දානය, ප්‍රියවචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව
අත්තඤ්ඤතා, සමානත්තතා,

1 - 1
2 - 1
3 - 2
4 - 2

(ලකුණු 02)

VI. දුටුගැමුණු රජතුමා/ දුටඨගාමිණී අභය/ දුටු ගැමුණු (හැමුණු, ගාමිණී ලියා ඇත්නම් ලකුණු නැත.)

(ලකුණු 02)

VII. ධාර්මිකව උපයා ගත් ධනය පරිභෝග කිරීමෙන් ලැබෙන සැපයයි.

(ලකුණු 02)

Scanned with CamScanner

VIII. මෙය නැති කල්හි මෙය ඇති නොවේ. මෙය නැති වීමෙන් මෙය නැති වේ./ මෙය නැති කල්හි මෙය නොවේ. මෙය නැති වී යාමෙන් මෙය නැතිව යයි.

(ලකුණු 02)

IX. බුදු ගුණ අලංකාරය - වීදාගම මෛත්‍රීය හිමි / වීදාගම හිමි.
පූජාවලිය - බුද්ධ පුත්‍ර හිමි / මහරහතා පිරිනිවන් හිමි.

(ලකුණු 02)

X. ථූපාරාමය

(ලකුණු 02)

10 **2.** (i) 'අනුසෝතගාමී' හා 'පටිසෝතගාමී'යන වචන දෙකෙහි අර්ථ දක්වන්න.
(ii) බුදු සිරිත පද්මාකාර ලෙස හඳුන්වන්නේ ඇයිදැයි පහදන්න.
(iii) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ ගෙනහැර දක්වන්න.

I.

- අනුසෝතගාමී යනු, ගඟ පහළට යන්නා සේ මිනිසා ද රාගාදී ක්ලේශ ධර්මයන් කරාම යොමු වීමයි.
- පටිසෝතගාමී යනු, උඩුගම්බලා යන්නා සේ රාගාදී ක්ලේශ ධර්මයන්ගෙන් මිදීමට උත්සාහවන්ත වීමයි.

ඒකාන්ත – 1 යි
ද්වීකාන්ත – 2 යි.

(ලකුණු 02)

II. බුදුරජාණන් වහන්සේගේ ජීවිතය පද්මාකාර යැයි දක්වා තිබේ. එනම් නෙළුම් මලකට උපමා කොට ඇත. අපිරිසිදු ජලය සහිත මඩ වගුරක හට ගන්නා නෙළුම් මල, අපිරිසිදු ජලය, මඩ ඉක්මවා සිට ජලයෙන් උඩට මතු වී විකසිත වී දැසත සුවඳ විහිදුවයි. එපරිද්දෙන්ම බුදුරජාණන් වහන්සේ ද රාගාදී කෙලෙස් වලින් දූෂිත වූ මිනිසුන් සිටින සමාජයේ ඉපිද එකී කෙලෙස් වලින් තොරව වැඩ විසූහ. එම නිසා බුදු සිරිත පද්මාකාර ලෙස හඳුන්වනු ලැබේ.

කෙටි පැහැදිලි කිරීමක් වේනම් සම්පූර්ණ ලකුණු දෙන්න

(ලකුණු 03)

Scanned with CamScanner

III. බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ කොහේද.

- අටශීල් දහමින් කම්පා නොවී සිටීමේ හැකියාව
- උපේක්ෂාවෙන් ක්‍රියා කිරීමේ හැකියාව
- දුක්ඛවිපාකයෙන් මිදී සුවඵලයට යාම
- විනය විරෝධී හා ඊති විරෝධී ක්‍රියාවන්ගෙන් මිදී විනයවන් වීම.
- යහපත් ශිෂ්‍ය පෞරුෂයක් ගොඩ නගා ගැනීමට හැකි වීම.
- කරුහව, ගෙවරය, ඊර්ෂ්‍යාව, පළිගැනීම වැනි සිරිත් සහිත සිසුන් අතර මෛත්‍රිය, කරුණාව, දයාව, අනුකම්පාව සහිතව ක්‍රියා කිරීමේ හැකියාව
- ගැටුම් වලින් තොරව, සාමකාමීව කටයුතු කිරීමේ හැකියාව

මෙබඳු ආදර්ශ අනක්වත් ඇති පිළිතුරකට සම්පූර්ණ ලකුණු දෙන්න

(ලකුණු 05)

3. (i) 'සුකරානි අසාධූනි' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කොට ලියන්න.
(ii) එම ගාථාවේ තේරුම ලියන්න.
(iii) පුද්ගලයා වරදින් මුදවා සුචරිතයෙහි යෙදවීම සඳහා ධම්මපදයෙන් ලැබිය හැකි ආදර්ශ අගය කරන්න.

I. සුකරානි අසාධූනි
අත්තනො අහිතානිච
යං වේ හිතං ච සාධුං ච
තං වේ පරම දුක්කරං

ගාථාව සම්පූර්ණයෙන් ලියා ඇත්නම් ලකුණු දෙන්න
අක්ෂර වින්‍යාසය නොසලකන්න

(ලකුණු 02)

II. තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසුය. යම් දෙයක් තමාට වැඩදායකද යහපත පිණිස පවතී ද එවැනි දේ කිරීම ඉතා අපහසුය.
ගාථා දෙක හෝ ඒ වගේ වැඩි ප්‍රමාණයක් ලියා දැක්වුවත් සම්පූර්ණ ලකුණු දෙන්න. *(ලකුණු 03)*

III. පුද්ගලයා වරදින් මුදවා සුචරිතයෙහි යෙදවීම සඳහා ධම්මපදය ආදර්ශ සපයයි. සත්වයෝ නිරන්තරයෙන් පාපයට නැඹුරු වෙති. අවැඩ දායක ක්‍රියා කිරීමට වැඩි කැමැත්තක් දක්වති. එනිසා හොඳ - නරක, හරි - වැරදි, යහපත - අයහපත පෙන්වාදී

Scanned with CamScanner

පුද්ගලයා යහ මාර්ගයට ගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වීම් ධම්ම පදයෙන් ලබා දේ. එම සදූපදේශයන් දේශ කාල පුද්ගල භේදයකින් තොරව ඕනෑම පුද්ගලයෙකුට අනුගමනය කොට යහපත සලසා ගැනීමට පුලුවන. වැරදි ක්‍රියාවන් හා එහි ඵල විපාකයන් යහපත් ක්‍රියාවන් හා එහි යහපත් ඵල විපාකයන් පිළිබඳව පුද්ගලයාට සදූපදේශ සමූහයක් ධම්මපදයෙන් ලබා දේ. එම උපදෙස් පිළිපැදීමෙන් පුද්ගල ජීවිතය ආලෝකවත් කර ගැනීමට පුලුවන. අදාළ නිදසුන් දෙකක්වත් ආශ්‍රයෙන් ලියා ඇති පිළිතුරකට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න

(ලකුණු 05)

4. (i) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි උඩ දිසාවට උපමා කරනු ලැබුයේ කවුරුන් ද?

(ii) උඩ දිසාවට අයත් සමාජ කණ්ඩායම් විසින් ඉටු කළ යුතු යුතුකම් **තුනක්** ලියා දක්වන්න.

(iii) ආපදා අවස්ථාවක දී අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම අගය කරන්න.

I. උඩ දිසාව - පැවිදි උතුමන් / මහණ බමුණන් / ශ්‍රමණ බ්‍රාහ්මණ.

(ලකුණු 02)

II. **ගිහි පක්ෂය ඉටුකළ යුතු යුතුකම් පහකි.** 1-1 2-2 3-3

1. මෛත්‍රී සහගතව ක්‍රියා කිරීම
2. මෛත්‍රී සහගතව කථා කිරීම
3. මෛත්‍රී සහගත සිත් පහළ කර ගැනීම
4. නිවසට පැමිණි විට සතුටින් පිළිගැනීම
5. ආමිසයෙන් සංග්‍රහ කිරීම

පැවිදි පක්ෂය විසින් ඉටුකළ යුතු යුතුකම් හයයි.

1. පවින් වැලැක්වීම
2. යහපත් ක්‍රියාවල යෙදවීම
3. හොඳ හිතින්ම අනුකම්පා කිරීම
4. නොඇසූ දේ කියා දීම
5. ඇසූ දේ වඩාත් පැහැදිලි කර දීම
6. සුගතියට මග පෙන්වීම

කවර හෝ යුතුකම් 3ක් දක්වා තිබේ නම් ලකුණු 03 ලබා දෙන්න

(ලකුණු 03)

Scanned with CamScanner

III. ආපදා අවස්ථාවක දී අනෙන්‍යාශ්‍රය වශයෙන් යුතුකම් ඉටු කිරීම ඉතා වැදගත් වේ. ස්වාභාවික හෝ මිනිස් ක්‍රියාකාරකම් මත සිදුවන ගංවතුර, සුළි සුළං, නාය යෑම්, භූමිකම්පා, වසංගත රෝග වැනි ආපදා අවස්ථාවන්හි දී එයට මුහුණ දෙන සහෝදර ජනතාවට ආහාරපාන, ඇඳුම් පැලඳුම්, මූල්‍යාධාර ආදී අත්‍යවශ්‍ය දෑ ඔහු ඔහුට දීම, මානසික සහනය සඳහා සුදුසු ක්‍රියාකාරකම් සිදු කිරීම, අවවාද අනුශාසනා ලබා දීම, දේපළ සුරක්ෂිතතාව,පහසුවැදි කිරීම වැනි යහපත් ක්‍රියාකාරකම් කළ හැකිය.

අනෙන්‍යාශ්‍රය යුතුකම් ඉටු කිරීම තුළින් ආර්ථික ගැටලු අවම කර ගැනීම, මානසික ශක්තිය ගොඩ නැඟීම, කායික මානසික නීරෝගීතාවය, අනන්‍යාශ්‍රය සුහදතාව සහ සහජීවනය ගොඩ නැඟීම වැනි යහපත් සමාජ ධර්ම ගොඩ නැඟේ. වර්තමානයේ අප මුහුණ දී සිටින කොරෝනා උවදුර වැනි අවස්ථාවන්හි දී මෙම තත්ත්වය ප්‍රබලව දැකගත හැකිය.

පිළිතුර සමස්තයක් සේ සලකා ලකුණු දෙන්න

(ලකුණු 05)

5. (i) සිව්වන ථෙරවාද ධර්ම සංගායනාව (පුස්තකාරූඪ සංගායනාව) පැවැත් වූ ස්ථානය හා සහභාගි වූ භික්ෂූන් සංඛ්‍යාව ලියා දක්වන්න.

(ii) එම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු **තුනක්** ලියන්න.

(iii) ධර්ම විනයෙහි අනාගත සුරක්ෂිතතාව සඳහා මෙම සංගායනාවේ ප්‍රතිඵල හේතු වූ ආකාරය පැහැදිලි කරන්න.

I.

- සිව්වන ථෙරවාදී ධර්ම සංගායනාව පැවැත්වූ ස්ථානය : මාතලේ අලුවිහාරය/ මාතලේ ආලෝක විහාරය/ අලු විහාරය/ අලු ලෙන
- සහභාගී වූ භික්ෂූන් සංඛ්‍යාව : භික්ෂූන් වහන්සේලා 500 නමක් ***(ලකුණු 02)***

II.

- පිරිසිදු ථෙරවාදී බුදු දහමට වෙනත් දුර්මත වලින් හානි වීම වලක්වා ගැනීම
- එවකට පැවති බැමිණිතියා සාගත තත්ත්වය
- මහා විහාරීය භික්ෂූන්ට රාජ්‍ය අනුග්‍රහය නොලැබීම
- දීර්ඝ කාලීනව පැවති යුධ වාතාවරණය නිසා වනගත වූ භික්ෂූන්ට ධර්මය පවත්වාගෙන යාමට කාය - චිත්ත විවේකය නොමැති වීම
- දකුණු ඉන්දීය ආක්‍රමණිකයින්ගෙන් රාජ්‍යයට සිදු වූ බලපෑම්
- ඇතැම් භික්ෂූන් වහන්සේලාගේ ශාසනික පිළිවෙත් පිරහී තිබීම
- භික්ෂූන් (ග්‍රන්ථ ධුරය විදර්ශනා ධුරය ලෙස) කණ්ඩායම් දෙකකට බෙදී සිටීම
- ග්‍රන්ථ ධුරය වැඩීමට ත්‍රිපිටකය ලේඛනාරූඪ කිරීම වැදගත් බව සිතීම
- ධර්මය ඇසීම, ඉගෙනීම හා පර්යේෂණ කිරීමට ලේඛනගතව තිබීම වඩාත් වැදගත් බව සිතීම

අදාළ කරුණු තුනක් ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න

(ලකුණු 03)

Scanned with CamScanner

III.

- ත්‍රිපිටක ධර්මය වාචෝද්ගතව පවත්වා ගෙන යාමෙන් එහි යම් විකෘතියක් වීමට තිබූ ඉඩකඩ මේ මඟින් මඟ හැරුණි.
- හීනයාන්තර වශයෙන් බෙදී විවිධ මතවාදයන්හි පිහිටා ධර්මය විවරණය කිරීම තුළින් ථෙරවාදී බුදු දහමට වැල්ල වීමට තිබූ අභියෝග නැති වී යාමට ඉඩ සැලසිණි.
- ථෙරවාදී බුදු දහම අභාවයට ගිය අවස්ථාවන්හි දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪව තිබීම නිසා නැවතත් එය ස්ථාපිත කිරීමට හැකිවීම තවත් වාසියකි.
- ථෙරවාදී බුදු දහම ලොව වෙනත් රටවල අභාවයට ගිය අවස්ථාවන්හි දී නැවත ස්ථාපිත කිරීමට ග්‍රන්ථාරූඪ වූ ත්‍රිපිටකය මඟින් අවස්ථාව සැලසුණි.
- බුදු දහම ස්ථාපිත නොවූ බටහිර රටවල බුදු දහම බෙදා හැරීමට ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කර තිබීම ප්‍රයෝජනවත් විය.
- මුඛ පරම්පරාගතව පුද්ගලයන් සතුව පවතිනවාට වඩා ස්ථාවරව, ලිඛිතව තිබීම නිසා විය සුරක්ෂිත කර ගැනීමට අවස්ථාවක් සැලසේ.

වී අනුව ධර්ම විනය දෙකෙහි අනාගත සුරක්ෂිතතාව මෙම සංගායනාව මඟින් සැලසුණි.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න

3න් එක් හිඟ්කර කර නිවැරදි ප්‍රකාශය. *(ලකුණු 05)*

නව කාරිනාව සම්මතයක් 2යි.

6. (i) ස්තූප ආකෘති හයෙන් **දෙකක්** නම් කරන්න.

(ii) ස්තූපයක රූපසටහනක් ඇඳ එහි කොටස් **තුනක්** නම් කරන්න.

(iii) ජාතික උරුමයන් සුරැකීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

I.


1. ඝණ්ඨාකාර - සීනුවක හැඩය ඇති / සෘජුකෝණාකාර හැඩය.
2. ඝටාකාර - කළයක හැඩය ඇති
3. බුබ්බුලාකාර - දිය බුබුලක හැඩය ඇති
4. ධාන්‍යාකාර - ධාන්‍ය ගොඩක හැඩය ඇති
5. පද්මාකාර - පියුමක හෙවත් නෙළුම් මලක හැඩය ඇති
6. ආමලකාකාර - නෙල්ලි ගෙඩියක හැඩය ඇති

මෙයින් දෙකක් නම්කර ඇත්නම් ලකුණු 02 ලබා දෙන්න

(ලකුණු 02)

Scanned with CamScanner

II.



කොටස් තුනක් නම් කර තිබේනම් ලකුණු තුන ලබා දෙන්න

1 - 1
2 - 2
3 - 3

(ලකුණු 03)

III. දිගු ඉතිහාසයකට උරුමකම් කියන හෙළ සංස්කෘතියේ ප්‍රෞඩත්වය ලොවට හෙළි කරන ජාතික උරුමයන් රැසක් අප සතුව පවතී. එකී උරුමයන් අනාගත පරපුර වෙනුවෙන් සුරකීම අප සතු යුතුකමකි. ඇතමුන් සිතා මතා කරනු ලබන ක්‍රියාකරකම් නිසා අප සතු බෞද්ධ කලා ශිල්ප විනාශ වීමේ තර්ජනයකට මුහුණ පා තිබේ. පුරාවස්තු මංකොල්ලය, නිදන් හෑරීම, අන්තවාදී ක්‍රියා ආදිය නිසා රටක් ජාතියක් වශයෙන් අප උරුම කරගෙන තිබෙන ජාතික උරුමයන්ට හානියක් සිදුවීමට ඉඩ නොදී ආරක්ෂා කර ගැනීම ශ්‍රී ලාංකික සියලු දෙනාගේ වගකීමකි. යුතුකමකි. එසේ ආරක්ෂා කර තැබීම තුළින් අපගේ මුතුන් මිත්තන් තුළ පැවති ශක්තිය, කලා කෞෂල්‍යය මෙන්ම පැරණි තාක්ෂණික ඥානයද අනාගත පරම්පරාවට උගත හැකිය.

සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න

(ලකුණු 05)

Scanned with CamScanner

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** පමණක් කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා

(ii) සමජීවිකතා

(iii) සකර අගතිය

(iv) නෙක්ඛම්ම පාරමිතාව

I. අනගාරික ධර්මපාල තුමා

1864 සැප්තැම්බර් මස 17 වන දින උපත ලත් දොන් ඩේවිඩ් හේවාවිතාරණ කුමරු මිෂනාරි පාසල් අධ්‍යාපනය ලැබීය. තම දෙමාපියන් සමග විහාරස්ථාන වලට ගොස් භික්ෂූන් වහන්සේලාගේ ඇසුර ලැබීය. ශ්‍රී ලංකාවට පැමිණි සර් හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා සමග රට තුළ සංචාරය කළ මෙතුමා ඕල්කට් තුමා ඉංග්‍රීසියෙන් කළ දේශන සිංහලට නැගීය. ඩේවිඩ් යන නම බැහැර ලූ ඔහු අනගාරික ධර්මපාල යන නම භාවිතා කළේය. මිෂනාරි අධ්‍යාපනය වෙනුවට බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා විශාල මෙහෙයක් ඉටු කළේය. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම මගින් සිංහල දරුවන්ට බෞද්ධ අධ්‍යාපනයක් ලබා දීමට වෙහෙසී කටයුතු කළේය.

මෙතුමා ඉන්දියාවට ගොස් හින්දූන් අත්පත් කර ගෙන තිබූ බුද්ධගයාව ඇතුළු බෞද්ධ සිද්ධස්ථාන බේරා ගැනීමට විශාල කාර්යභාරයක් ඉටු කළේය. එංගලන්තයේ ලන්ඩන් බෞද්ධ මධ්‍යස්ථානය, බරණැස මූලගන්ධ කුටි විහාරය, කල්කටාවේ ධර්මරාජික විහාරය, බුද්ධගයාවේ හා මදුරාසියේ බෞද්ධ විශ්‍රාමශාලා ආදිය ඉදි කළේය. විශාල ශාසනික සේවාවක් ඉටු කළ මෙතුමා පසුව සිරි දේවමිත්ත නමින් පැවිදිව උපසම්පදාව ලැබීය. 1933 අප්‍රේල් මස 29 වන දින අපවත් විය. සිංහල බෞද්ධයින් අවදි කරලීමට, දහම් අධ්‍යාපනය නගා සිටුවීමට මෙන්ම සම්බුද්ධ සාසනය පුබුදුවාලීමට ද අතිවිශාල මෙහෙයක් මෙතුමාගෙන් ඉටුවිය.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න

(ලකුණු 05)

II. සමජීවිකතා

බුදුරජාණන් වහන්සේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී පුද්ගලයාගේ මෙලොව හිත සුව පිණිස දේශනා කළ කරුණු අතර සිව්වන කරුණ ලෙස සමජීවිකතාව හඳුන්වා දිය හැකිය. තමාගේ ආදායම හා වියදම හොඳින් දැන ආදායමට වඩා වියදම වැඩි නොකොට එනම් අය වැය මනාව පාලනය කර ගැනීම සමජීවිකතාවයි. ඇතැම් අය තමා ලබන ආදායමට වඩා වැඩියෙන් වියදම් කිරීමට පුරුදුව සිටිති. අඩු ආදායමක් ලබා වැඩියෙන් වියදම් කිරීම තම පරිහානියට හේතු වේ. එසේම ඉහළ ආදායමක් ලබා ඉතා සුළුවෙන් වියදම් කරමින් ලෝභීව ජීවත් වීම ද අනුමත කළ නොහැකිය. මේ අනුව අයවැය සමව දැන පරිහරණය කිරීම බුදු දහම අනුමත කරයි. එය සමජීවිකතාවයි

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න

(ලකුණු 05)

Scanned with CamScanner

III. සතර අගති

ඡන්දය, ද්වේෂය, භය, මෝහය යනු සතර අගතියයි. අගතිගාමී වීම යනු ධර්මයට, යුක්තියට, නීතියට පටහැනිව ක්‍රියා කිරීමයි.

- ඡන්දය යනු කැමැත්තයි. නෑදෑ හිතවත්කම්, පාක්ෂිකත්වය ආදිය සලකා කැමැත්ත නිසා අගතිගාමී විය හැක.
- ද්වේෂය යනු වෛරයෙන්, පරහෙන් ක්‍රියා කිරීමයි. තමන්ට විරුද්ධ, තමාගේ නොවන, තම පාක්ෂික නොවන අයට වෛරීව අසාධාරණකම් කිරීමයි.
- භය යනු බිය වීමයි. යම් පුද්ගලයන්ට, සංවිධාන වලට බිය වී අගතිගාමී වීමයි.
- මෝහය යනු මුලාවයි. හොඳ - නරක, යුක්තිය - අයුක්තිය තෝරා බේරා ගැනීමට ඇති නොහැකියාවයි. නීක්ෂණ බුද්ධියෙන් තොරව තීරණ ගැනීමයි. අගතිගාමී වීමයි.
- අගතිගාමී වන්නාගේ යසස පිරිහීමට පත්වන බව දක්වා තිබේ. ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා සතර අගතියෙන් තොරවීම අවශ්‍ය බව දක්වා තිබේ.

නෑ කිරීමට හේතු 4යි.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න

4 ම විස්තර කිරීමට 1 බැගින් 5යි.

(ලකුණු 05)

IV. නෙක්ඛම්ම පාරමිතාව

බුද්ධ කාරක ධර්ම ලෙස හඳුන්වන දස පාරමිතා ධර්ම අතර තුන්වැන්න නෙක්ඛම්ම පාරමිතාවයි. පංච ඉන්ද්‍රියන් පිනවීමට ඇති ආශාවෙන් ඉවත් වීමේ ප්‍රතිපදාව නෙක්ඛම්ම නමින් හැඳින්වේ. තෘෂ්ණා මාන මිත්‍යා දෘෂ්ඨියෙන් මිදී ප්‍රඥා කරුණාවෙන් යුතුව පංචකාම සම්පත්තියෙන් ඉවත් වීම නෙක්ඛම්ම පාරමිතාවේ මූලික අංගයයි. බෝසත් උතුමෝ මෙය තුන් ආකාරයකින් සම්පූර්ණ කරති. තම බාහිර වස්තු, අඹු දරුවන් අත් හැරීම නෙක්ඛම්ම පාරමිතාවයි, ශරීරාවයව නැති වුවත් කාමයන්ගෙන් වෙන් වී සිටීම නෙක්ඛම්ම උප පාරමිතාවයි. ජීවිතයට හානියක් වුවද, කම් සැප නොවිඳීම නෙක්ඛම්ම පරමත්ථ පාරමිතාවයි. අප මහ බෝසතාණන් වහන්සේ නෙක්ඛම්ම පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය මඛාදේව ජාතකයෙන් පැහැදිලි වේ.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න

(ලකුණු 05)

Scanned with CamScanner